පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 290

ආයතනයේ නම: කර්මාන්ත අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ඉණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 290

நிறுவனத்தின் பெயர்: கைத்தொழில் அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் நிறுவன கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 290

Name of the Institution: Ministry of Industries

Submission of observations of Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee On Public Accounts in terms of Standing Order No. 119(4)

ගරු අමාත්‍යතුමා
கௌரவ அமைச்சர்
Hon. Minister
011-2435248
Fax : 011- 2390885

අමාත්‍යාංශය
அமைச்சு
Ministry
011- 2392149
011-2392150
Fax : 011-2390941

ලේකම්
செயலாளர்
Secretary
011-2436123
011-2436124
Fax : 011-2449402

විද්‍යුත්තැපෑල
மின்னஞ்சல்
E -mail
ministryindcom@gmail.co

කර්මාන්ත අමාත්‍යාංශය
கைத்தொழில் அமைச்சு
MINISTRY OF INDUSTRIES

තැ.පෙ. 570, 73/1, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව , த.பெ. இல. 570, 73/1, காலி வீதி, கொழும்பு 03, இலங்கை
P.O.Box 570, 73/1, Galle Road, Colombo 03, Sri Lanka

මගේ අංකය
எனது இல
My No: MIC/FIN/02/05/06

ඔබේ අංකය
உமது இல
Your No.

දිනය
திகதி
Date 2024.01.

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් ස්ථාවර නියෝග 119(4) අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාව සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියා මාර්ග සහ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු සැසි අංකය:- අංක 290

ආයතනයේ නම :- කර්මාන්ත අමාත්‍යාංශය

2021 වර්ෂයට අදාලව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් හඳුනාගත් දුර්වලතා	එම දුර්වලතා මග හරවා ගැනීමට ගන්නා ලද ක්‍රියා මාර්ග / වර්තමාන තත්වය
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුනි.	සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කරමින් පවතී. නිලධාරීන්ට අනුයුක්ත කර ඇති අනෙක් වාහනවල ද රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කිරීමට පියවර ගෙන ඇත.
වාහනයක් ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබිණි.	කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ගර්හිත වාහන අපහරණ කිරීමේ කටයුතු ප්‍රමාද විය. වර්තමාන තත්වය පහත පරිදි වේ. 2022-2023 වාහන අපහරණ අවස්ථාවේදී KW 8777 ජීප් රථය රු. 12,368,000/- මුදලකට හා KY 3709 ජීප් රථය රු. 13,989,989/- මුදලකට අපහරණ කටයුතු සිදු කර අදාල මුදල් රජයේ ආදායමට බැර කර ඇත. KH 2765 අපහරණයට ඉදිරිපත් කළ නමුත් ලැබුණු ලංසු ඉගයන් තක්සේරු අගයට වඩා අඩු බැවින් විකිණීමට නොහැකි විය. 2023 - 2024 වාහන අපහරණය කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර ඒ සඳහා නැවත ඉදිරිපත් කර ඇත. 18 – 2230 වාහනය වාහන අපහරණය කිරීමේ අවස්ථාවේදී අඛලි ලෙස අපහරණය කිරීමට කටයුතු කරන ලද නමුත් වැඩිම ලංසුව ඉදිරිපත් කරන ලද පුද්ගලයා විසින් වාහනය මුදල් ගෙවා රැගෙන නොයන ලදී. ඉන් පසු දෙවන වැඩිම ලංසුව ඉදිරිපත් කරන ලද පුද්ගලයා වෙත වාහනය ලබා දීමට කටයුතු කරන ලද නමුත් ඔහු ද වාහනය රැගෙන නොයන ලදී.

	GA-8170 හා JN-3665 වාහන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීම මත එහි රාජකාරි සඳහා පවරා දී ඇත.
රජයේ වාහන ඇනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොනිබුණි.	2019-2022 කාලය තුල කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් බොහෝ රාජකාරී අඩපණ වී තිබූ අතර, අනතුරු සම්බන්ධව මු.රෙ. පරීක්ෂණය ද සිදු කිරීම ප්‍රමාද වී තිබුණි. මේ වන විට පහත පරිදි කටයුතු අවසන් කර ඇත. CAE - 5402 - මු.රෙ. ප්‍රකාරව කමිටුවක් පත්කර පරීක්ෂණයක් සිදු කර ඇත. රක්ෂණ මූදලින් ආවරණය නොවූ මුදල වන රු.114,000.00, වගකිව යුතු නිලධාරීගෙන් අය කිරීමට කටයුතු කර ඇත. නිලධාරියා එම මුදල කොටස් වශයෙන් ගෙවීමට ඉල්ලීමක් කර ඇති අතර ඒ අනුව දැනට රු.35,000.00ක් ගෙවා ඇත. CAU -2005, KO -5818, KL- 4080 හා KQ-6008 වාහන සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කමිටු පත්කර පරීක්ෂණ සිදු කර ඇති අතර කමිටු නිර්දේශ අනුව අදාළ කටයුතු සිදු කර ඇත.
නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	නියමිත කාලයෙන් බැහැරව වෙනත් ආයතන වෙත ප්‍රතිපාදන වෙන් කර ඇත්තේ එම ආයතන සමග සාකච්ජා කර අදාල වර්ෂය තුල නියමිත කාර්යයන් නිසි පරිදි අවසන් කල හැකි බවට අදාල ආයතන එකඟ වූ බැවිනි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුනි.	සේවය හැරගිය නිලධාරීන් වන ඩී.එම්.ජී.පී.එම්.ශ්‍යාමලී මිය අවුරුදු 10ට වඩා වැඩි සේවා කාලයක් සහිත බැවින් ඇප කරුවන් නොමැති අතර එම නියා මෙම නිලධාරිණියගේ හිඟ ණය ශේෂය වන රු.78.750/- මුදල ලයකිරීම සම්බන්ධයෙන් නීති කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. ඒ.එල්.එම්.මින්හාර් හා එම්.එස්.එන්.පී.ඩබ්.එම්.ආර්.අයි.ඒ.බණ්ඩාර යන අයගේ ණය ශේෂ වාරික වශයෙන් ඇපකරුවන්ගෙන් මාසිකව අයකරනු ලැබේ. මියගිය නිලධාරීන් වන එස්.නිරුන්තිගන් හා ඊ.ජේ.එම්.එන්.එස්.ඒකනායක යන නිලධාරීන්ගේ මරණ පාරිතෝෂිකයෙන් දැනටමත් පිළිවෙළින් රු.47,620.00ක් හා රු.148,600.00ක් වූ ණය ශේෂ අයකරගෙන අවසන් වන අතර මියගිය ඩී.ම්.ඩී.රත්නසිරි නිලධාරියාගේ ණය ශේෂය වන රු.150,777.95ක මුදල මරණ පාරිතෝෂිකයෙන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. වැඩ තහනම්කර ඇති නිලධාරී ඊ.කේ.ඩී.ප්‍රනාන්දු මහතාද මේ වන විට මියගොස් ඇති අතර යැපෙන්නන්ටද, ගෙවීමේ හැකියාවක් නොමැති බව දන්වා ඇති හෙයින් රු.100,208.00ක් වූ ඔහුගේ ණය ශේෂය කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට රාජ්‍ය මූදල් දෙපාර්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කර ඇත.

පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	ගිණුම් අංශයේ පොදු තැන්පත් සම්බන්ධයෙන් ලෙජරයක් පවත්වාගෙන යන අතර ඕනෑම අවස්ථාවක එක් එක් ආයතන වෙත නිදහස් කිරීමට ඇති තැන්පතු සම්බන්ධ විස්තර ඇත. ඊට උමතරව සංවර්ධන හා අනෙකුත් අංශ වෙත ඔවුන් විසින් කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධව ලේඛණයක් පවත්වාගෙන යන ලෙස දැනුවත් කර ඇත. 2022.12.31 දිනට පැවති රු. 20,279,073.00 කාවකාලික රඳවා ගැනීමේ තැන්පතු ශේෂයෙන් 2023 වසර තුලදී රු.876,256.51ක මුදලක් රජයේ ආදායමට බැර කර ඇති අතර රු. 2,141,832.99 ක මුදලක් අදාල පාර්ශව වෙත ගෙවා නිදහස් කර ඇත. මු.රෙ. 571 ප්‍රකාරව ඉඩම් සම්බන්ධ රඳවා ගැනීම් වසර 10ක් දක්වා රඳවා ගැනීම ගැටලුවක් නොවන අතර ඉදිරියේදී ව්‍යාපෘතීන් වල වැඩ අවසන් වන පරිදි,අදාල අංශ විසින් දැනුම් දීමෙන් අනතුරුව නිදහස් කල යුතු රැඳවුම් මුදල් ශේෂයන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවත්ත මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	2021 ගිණුම් වර්ෂය සඳහා විගණකාධිපති විසින් ගිණුම් විගණනය කර ඒ සඳහා තත්වාගණනය කල මතයක් ගිණුම් සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කර ඇත.එහිදී යම් යම් කරුණු වලට යටත්ව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ බවක් ඇති බව ප්‍රකාශයට පත් කර ඇත. එබැවින් මෙහි සඳහන් පරිදි විගණන මතය ව්‍යාවත්ත වන මට්ටමේ හෝ අහිතකර මතයක් ලබා දීමේ තත්වයක් විගණකාධිපති විසින් පෙන්වාදී නොමැත.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	2021 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ පෙන්වා ද ඇති බොහෝ නිර්දේශ 2023 වර්ෂය වන විට ක්‍රියාත්මක කර ඇති අතර සමහර නිර්දේශයන් ඉදිරියේදී ක්‍රියාත්මක කරන බව කාරුණිකව පෙන්වා දෙමි.
නිලධාරීන්ගෙන් රජයට සිදුවූ පාඩු වෙනුවෙන් මු.රෙ. 156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.	සමහර අලාභ අයකරගනිමින් පවතින අතර තවත් සමහර අලාභ අයකර ගැනීමට නීතිමය කටයුතු කරමින් පවතී.

වෛද්‍ය රමේෂ් පතිරණ (පා.ම.)
කර්මාන්ත අමාත්‍ය